# සමරු කාසි නිකුත් කිරීම සහ එහි සන්නිවේදන ලක්ෂණ (ආගමික අවස්ථාවන් සැමරීම වෙනුවෙන් නිකුත් කරන ලද සමරු කාසි ඇසුරින්)

මඩකුඹුර එන්.ඩබ්.එම්.එන්.එස්.කේ.එන්.[1]

පුරාණයේ සිට ශ්‍රී ලංකාව පාලනය කළ නරපතියන් විවිධ ආර්ථික ප්‍රතිපත්තීන් අනුගමනය කරන ලදී. එහිදී ක්‍රි.පූ.4-6 වැනි ශතවර්ෂයන්ගේ සිට මේ දක්වා ම ලංකාවේ කාසි භාවිත වූ බව හඳුනාගත හැකිය. සමරු කාසි විශේෂ ආගමික උත්සව, සිද්ධීන් හා පුද්ගල සැමරීම් උදෙසාත් ශ්‍රී ලංකාවට දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන සිද්ධීන් සැමරීම උදෙසාත් ශ්‍රී ලංකා මහබැංකුව සමරු කාසි නිකුත් කරනු ලැබේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ආගමික අවස්ථාවන් සැමරීම වෙනුවෙන් නිකුත් කරන ලද සමරු කාසි හා ඒවායේ සන්නිවේදන ලක්ෂණයන් පිළිබඳ අධ්‍යයනය කිරීමයි. මෙම පර්යේෂණය සඳහා තොරතුරු රැස් කිරීමේදී ද්විතියික දත්ත රැස්කිරීමේ ක්‍රමවේදයන් භාවිතා කරන ලදි. ශ්‍රී ලංකාවේ ප්‍රථම සමරු කාසිය 1957 වර්ෂයේ බුද්ධ පරිනිර්වාණයෙන් වසර 2500ක් සපිරෙන අවස්ථාවේදී රුපියල් පහ සහ රුපියල වශයෙන් වූ කාසි යුගලයක් නිකුත් කරන ලදි. රුපියල් පහේ කාසියේ ප්‍රතිමුඛයේ ද අනුරාධපුර යුගයේ සඳකඩපහණත් අභිමුඛයේ පිච්ච මල් මෝස්තරයක් හා නෙලුම් මලක් සහිතය. රුපියලේ කාසි ප්‍රතිමුඛයේ ධර්ම චක්‍රය මත චෛත්‍යයක් ද අභිමුඛයේ සිංහල අන්නාසි මල් මෝස්තරයක් ද සහිතය. අනුබුදු මිහිදු හිමි වැඩමකොට වසර 2300ක් පිරීම නිමිත්තෙන් 1993 වර්ෂයේදී රුපියල් 500ක් නාමික අගය වූ රිදී කාසියක් නිකුත් කරන ලදි. මෙහි ප්‍රතිමුඛයේ මිහින්තලා කන්දට උඩින් ධර්ම චක්‍රයක් ද නිරූපණය කර තිබේ. අභිමුඛයේ බෝධි වෘක්ෂයේ රූපයකි. ස්‍යාමෝපාලි මහා නිකායේ 250වන සංවත්සරය සැමරීම උදෙසා රුපියල් පහේ අගයෙන් යුත් කාසි 2ක් නිකුත් කරන ලදී. එක් කාසියක ප්‍රතිමුඛයේ ප්‍රවර උපාලි හිමියන්ගේ රුව ද අනෙක් කාසි ප්‍රතිමුඛයේ ශ්‍රී සරණංකර මාහිමියන්ගේ උඩුකය පින්තූරයක් ද දක්වේ. 2550 බුද්ධ ජයන්ති සැමරුම වෙනුවෙන් 2006දී නිකුත් කරන ලද කාසි රුපියල් 2000, 1500, 5 නාමික අගයන්ගෙන් යුක්ත වේ. මින් 2000 කාසිය රිදී කාසියක් වන අතර එහි මුහුණතෙහි සිද්ධාර්ථ කුමාරයාගේ උත්පත්තිය ද පිටුපස නෙලුම් විලක සහ අශෝක ස්ථම්භයේ ධර්ම චක්‍රයේ අනුරුවක් ද දක්වා ඇත. 1500 කාසිය ද 2000 කාසියට සමාන වූ සන්නිවේදන ලක්ෂණ වලින් යුක්තවේ. 5 කාසිය තුළ මුහුණත පැතිකඩෙහි ශ්‍රී පාදස්ථානය හා එහි මුදුනත ධර්ම චක්‍රය නිරූපිතය. බෞද්ධාගමික ලක්ෂණ ඉස්මතු කර දැක්වීමටත් ඊට උචිත සංකේත යොදා තිබීමත් එම සංකේත ඇසුරින් සංකේතාත්මක සන්නිවේදනයක් සිදු කිරීමට ගත් ප්‍රයත්නය සාර්ථක වී ඇතිබව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :** සමරු කාසි, සන්නිවේදන ලක්ෂණ, ආගමික අවස්ථා

[1]ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. snadeesha356@gmail.com